# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1800/32 – 2013 මාර්තු 08 වැනි සිකුරාදා – 2013.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: බිය3/1/8/43/1938.

වර්ෂ 1996 මාර්තු මස 12 වැනි දින අංක 914/7 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමේ සඳහන් මු.පි.ගම්. 1938 දරන පිඹුරේ කැබලි අංක 4 2/2 කැබලි අංක 22 සහ 23 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**කැබලි අංක 22**
ඉඩමේ නම: ආචාරිගේවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. ඒ. ලහිරු නිශාන්, නො. 185/1/ඒ. බියගම; ප්‍රමාණය: හෙක්. 0.0034.

**කැබලි අංක 23**
ඉඩමේ නම: ආචාරිගේවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ප්‍රියන්ත ජයසිංහ, නවනුවර පාර, බියගම; ප්‍රමාණය: හෙක්. 0.0023.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 අප්‍රේල් මස 29 වැනි දින පෙ.ව. 10.00 ට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 අප්‍රේල් මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

චම්පිකා ඩී. ධර්මසේන,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2013 මාර්තු මස 05 වැනි දින.
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
සපුගස්කන්ද - මාකොළ.

03 - 971


1A – G 17399 – 350 (2013/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*